සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022**
**Practice Test - Grade 13 - 2022**

**සිංහල II** | **71 S II**

කාලය: පැය තුනයි

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ..........................................

උපදෙස් :-
* I කොටසේ I ප්‍රශ්න ද II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* I ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මේ ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරුත් සමඟ අමුණා භාරදෙන්න.

## I කොටස

01. රට යන්නෙහි අන්තර්ගත ව්‍යඤ්ජනවල උත්පත්ති ස්ථානය වනුයේ,
   1) දන්තජ ය.   2) මූර්ධජ ය.   3) ඕෂ්ඨජ ය.   4) තාලුජ ය.   5) කණ්ඨජ ය.

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
   1) ප්‍රත්‍යවේක්ෂණ, විස්මයානුකූල, ලේඛණාරූඪ, සාන්දෘශ්ඨික
   2) ප්‍රත්‍යවේක්ෂණ, විශ්මයානුකූල, ලේකනාරූඪ, සාන්දාෂ්ඨික
   3) ප්‍රත්‍යවෙක්ෂණ, විෂ්මයානුකූල, ලේකණාරූඪ, සාන්දෘෂ්ටික
   4) ප්‍රත්‍යාවේක්ෂන, විස්මයානුකූල, ලේඛනාරූඪ, සාන්දෘෂ්ඨික
   5) ප්‍රත්‍යාවේක්ෂණ, විස්මයානුකූල, ලේඛනාරූඪ, සාන්දෘෂ්ටික

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
   1) පරෝපාකාරය, රසවාහිනිය, සිදත් සඟරාව, සුබෝධාලංකාරය.
   2) රසවාහිනිය, පරෝපකාරය, සිදත් සඟරාව, සුබෝධාලංකාරය.
   3) සුබෝධාලංකාරය, සිදත් සඟරාව, රසවාහිනිය, පරෝපකාරය.
   4) සුබෝධාලංකාරය, සිදත් සඟරාව, පරෝපාකාරය, රසවාහිනිය.
   5) පරෝපාකාරය, සුබෝධාලංකාරය, සිදත් සඟරාව, රසවාහිනිය.

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1) යංශය යෙදෙන්නේ වචනයක හල් අකුරකට පසුව යෙදෙන 'ර්' අක්ෂරය වෙනුවට ය.
   2) යංශයේ හිසමත / යංශයට උඩින් කිසිවිටක රේඵය යොදන්නේ නැත.
   3) අක්ෂර රූපයක් ලෙස යංශය යෙදෙන කල, ඊට මුලින් වූ අකුරේ ''හල්'' බව අහෝසි වේ.
   4) සැමවිට ම ර්/ර අකුරකට පසුව යංශය යෙදේ.
   5) යංශය යෙදෙන සැම ස්ථානයක ම රේඵය යෙදීම ද අනිවාර්ය වේ.

1.5 එකිනෙකට අනුරූප වනසේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1) ගද්‍ය ග්‍රන්ථ, විමර්ශන කෘති, භෝජන සංග්‍රහය, කෝකිල සඳෙස
2) නභෝ ගර්භය, ශුභ මොහොත, භාණ්ඩ ප්‍රවාහනය, තාපස ආරාමය.
3) ප්‍රබන්ධ සාහිත්‍යය, ශික්ෂා මාර්ගය, වර්ෂා කල, විනිශ්චය මණ්ඩලය.
4) වර්තමාන ව්‍යවහාරය, යොවුන් චෛතසික, මහාර්ග ප්‍රතිපත්ති, ප්‍රබුද්ධ කව
5) පර්වත මස්තකය, මනෝරම්‍යය ලෝක, අල්පේච්ඡ ජීවිතය, කල්‍යාණ මාර්ගය.

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක්ද?

1) නිතඹ, භාණ්ඩ, දුර්ලභ, ප්‍රමාණ
2) කීර්ති, සාගර, මාතෘ, කොමල
3) ප්‍රතිබිම්භ, පටිපාටි, ආචාර්ය, අඤ්ජන
4) චෝල, සවනක්, නීතිඥ, ඌන
5) ස්ථාවර, චන්දන, විසිතුරු, මිථ්‍යාදෘෂ්ටි

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1) තිලකුණු, සිසිල්, අදිටන්, මඟුල්
2) අකුරු, ඇඟිලි, සැදෑතිස්, ආකර
3) ඉඳුවර, දිඹුලාගල, ලෝල, කිඹුල්
4) අවවාද, නිදන්, නිදසුන්, විමසුම්
5) වෙසෙස්, චාලක, වෙසමුණි, පමොද

1.8 විභක්ති, අන්‍යාර්ථ, විශේෂණ, අව්‍යය සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

1) දෙතිස්වද, දසබල, ළමා පොත්, අනතුරු
2) ළමාපොත්, දසබල, දෙතිස්වද, අනතුරු
3) ළමාපොත්, දෙතිස්වද, දසබල, අනතුරු
4) දෙතිස්වද, අනතුරු, ළමා පොත්, දසබල
5) ළමාපොත්, අනතුරු, දසබල, දෙතිස්වද

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1) බේරෙන, වැපිරෙන, නැවෙන, ගෙරවෙන
2) සැරසිලි, සැරව්ලි, සැනසිලි, සැසඳිලි
3) නැගු, පැගු, පෙඟු, සිඟු
4) නිවන, මවන, රවන, සවන
5) සිතුම්, පැතුම්, නැටුම්, විමසුම්

1.10 පහත සඳහන් උද්ධෘතවල **තදකළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ) **නැගෙතත්** අවර ගිරගින් දිනකර මඬල
ඇ) හවසට වැඩ ඇරී අත් දෙක රිදුම් **දෙන**
ඉ) බත් හැළියක් බඳුව ළං වූ **උතුරනට**
ඊ) ඒත් තරහ නැත වී කුරුලනි **අසව**

1) අසම්භව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, විධික්‍රියා
2) පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3) අසම්භාවය්‍ය ක්‍රියා, පූර්වක්‍රියා, අපර ක්‍රියා, විධි ක්‍රියා
4) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
5) අපර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1) අරටු, වකුටු, දොරටු, පිහාටු
2) කොපුලත්, නුවනත්, සවනත්, සිරිමත්
3) දඬුමුවා, රිදී මුවා, වැලි මුවා, රන්මුවා
4) කැඳිති, සිඟිති, පොඩිති, කිනිති
5) නාගරික, ව්‍යාපාරික, පෞද්ගලික, චූලික

1.12 උපසර්ගයක් **යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

1) අබිමන්, අභිමාන, අභ්‍යවකාශ, අභිධර්ම  2) දුගඳ, දුලබ, දුසිරිත්, දුම්ඳු
3) නිර්මාණ, නිර්මල, නිර්ලෝභ, නිර්ධන  4) සම්බන්ධ,සම්පත්ති, සම්මාන, සම්මන්ත්‍රණ
5) උද්ගත, උත්පත්ති, උල්ලංඝන, උද්භිද

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1) නිතර, නිති, නිබඳ ඉතින්  2) මුත්, මිස, හැර, විනා  3) ලෙස, බදු, එව්, අයුරු
4) එම්බා, එම්බල, බොල, පබඳ  5) පුන, නැවැත, යළි, වැළි

1.14 ''කාව්‍ය **සාහිත්‍යය** නංවාලීමට වර්තමාන **කවිකිවිදියන්** දක්වනුයේ **අල්පෝත්සාහයකි**'' යන වාක්‍යයේ වචන යෙදී ඇති පිළිවෙළ අනුව පද කළු අකුරෙන් අති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

1) තද්ධිත, සන්ධි, සමාස  2) සමාස, සන්ධි, තද්ධිත
3) සන්ධි, සමාස, තද්ධිත  4) තද්ධිත, සමාස, සන්ධි
5) සමාස, තද්ධිත, සන්ධි

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1) ලියන, බලන, ලියෙන, හැඩෙන  2) කියුම්, නැටුම්, හැඩීම්, පවුම්
3) මතුළ, විචාළ, කළ, හළ  4) ගයන්නා, රඟන්නා, සිතන්නා, හිගන්නා
5) නටමින්, පනිමින්, කෙරෙමින්, රකිමින්

1.16 සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

1) අසුරයා, නොමිනිස් අනලස උච්චාරණ  2) බඹදත්, දෙව්දත් අනුබල සොරබිය
3) සරාසඳ, දහම්සොඬ, තෙරුවන, ගී නැටුම්  4) දුන්වත්, දැම්දුරු, සිවුරුපිළි, බුදුගුණ
5) දුලද, පබල, නරසී, සරස

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

1) ගිරග, තරිඳු, දිගැසි, මතැත්  2) පසැස්, මතුරෙව්, උමාඟන, අතිනැද
3) තෙතින්, මෙදෑතුර, සිත්වරු, පිරියම්  4) නිරතුරු, පොරොව, පුනරුත්, සිපියෙව්
5) සිව්රඟ, කටුවල, නිරොද, සුරිඳු

1.18 ව්‍යාකරණානුකූලව නොගැලපෙන වරණය තෝරන්න.

1) ප්‍රකෘති, ප්‍රයෝග ප්‍රමේය, ප්‍රමේහ  2) කරනු, වළඳනු, නැඟුම්, සිඳුම්
3) නම්, වනාහි, වූ කලී, ම  4) කවිත්ව, ශිෂ්‍යත්ව, ලඝුත්ව, ගුරුත්ව
5) ආධිපත්‍ය, වෛකල්‍ය, සෞඛ්‍ය අන්‍ය

1.19 ව්‍යාකරණානුකූලව නිරවද්‍ය වාක්‍ය තෝරන්න.

1) මැණියන් දැ දරුවන් සැනසූදැ ය.  2) ගසුත් වැලුත් සුළඟට වැනෙත්
3) තොප වෙණ සඳති'යි උනිම්  4) අප දැනට එම ගමෙහි නැත
5) හේ කම්කරුවෙක් සේ සේවය කළේය.

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වර්ණය තෝරන්න.

1) බුදුන් දෙසුයේ සිවුසස් ය  2) ඔහු නිතර එනවා
3) අපි මේ වැඩ කළ යුතු ය  4) මගෙ මොකෝ, මගෙ දෙයැක්යැ
5) මොකද? මේ අද වෙලා තියෙන්නේ  (ලකුණු 20)

## II කොටස

❖ **මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න සතරකට පමණක් පිළිතුරු සපයන්න.**

02. අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බොහෝ සිංහල කාව්‍යයන් රචනා වී ඇත්තේ එක් කවියෙකුගේ පරිශ්‍රමයෙනි. සම්පූර්ණ කාව්‍යයම ඔහුගේ ඒ පරිශ්‍රමයෙහි ප්‍රතිඵලය වෙයි. එහෙත් ප්‍රශස්ති කාව්‍ය සම්පාදනය වූයේ එසේ නොවේ. රාජ සභාවෙහි සිටි විවිධ කවීන් රජු අරබයා ගයන ලද ප්‍රශස්ති කවි සංග්‍රහ කිරීමෙනි. කුඩා මොහොට්ටාල, බින්තැන්නේ ස්වාමි වැන්නන්ගේ ප්‍රශස්ති කාව්‍ය ඔවුන් විසින්ම රාජ සභාවෙහි වරින් වර ගයන ලද කවි සංග්‍රහ කිරීමක් ලෙස සැලකිය හැකිය. ඇතැම් විට කිසියම් කවියෙකුට හිමි කොට ඇති ප්‍රශස්ති කාව්‍යයක දක්නට ලැබෙන පද්‍ය වෙනත් කවියෙකුගේ යැයි සම්මත කාව්‍යයක ද දැකිය හැකි බව ඉහත සඳහන් විණි. එනිසා ඇතැම් ප්‍රශස්ති කාව්‍ය විවිධ කවීන් ගැයූ කවි සංග්‍රහ කළ කවියා කාව්‍ය කර්තෘ වශයෙන් හඳුන්වන්නට ද ඇත.

සෙසු කාව්‍ය පළමුවෙන් ගයා දෙවැනිව ලියා තැබීමේ ප්‍රතිඵල වශයෙන් බිහි වූයේ නොවේ. කවීන් විසින් පළමුව ලියා තැබීම නිසාම පහළ වූ කාව්‍ය වෙයි. එහිදී උපදේශ කාව්‍ය භක්ති කාව්‍ය හා සන්දේශ කාව්‍ය හැරුණු විට කිසියම් කථාවස්තුවක් කියා පෑම සෙසු පැරණි කාව්‍යයන්හි ලක්ෂණය විය. එනිසා ආරම්භයේ සිට අවසානය දක්වා අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ සිදුවීම් මාලාවක් අපි එහිදී දකිමු. එහෙත් කිසියම් යුද්ධයක් පිළිබඳව විස්තර කැරෙන හටන් කාව්‍යයක හැරුණු විට සෙසු ප්‍රශස්ති කාව්‍යයක දැකිය හැක්කේ මුක්තක හෙවත් එක් පද්‍යයකට එක් වැනුමක් සීමා වූ අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් තොර පද්‍ය රාශියකි. පැරණි කාව්‍ය බොහෝ විටම ආගමික මුහුණුවරක් ගනී. විශේෂයෙන් බෝසත් සිරිත් වැනුම මගින් බුදුගුණ වැනුම ප්‍රධාන කාර්යය ලෙස සැලකිණි.

i. ප්‍රශස්ති කාව්‍ය සම්පාදනය වූයේ කෙසේ ද?
ii. කාව්‍ය කර්තෘ වශයෙන් හඳුන්වා ඇත්තේ කාහට ද?
iii. හටන් කාව්‍යයන්හි සඳහන් වන්නේ කුමක්ද?
iv. ප්‍රශස්ති කාව්‍යයක දැකිය හැකි ලක්ෂණයක් සඳහන් කරන්න.
v. බොහෝ පැරණි කාව්‍යයන්හි දක්නට ලැබෙන අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ සිදුවීම් ඇතුළත් නොවන කාව්‍ය වර්ග 2ක් නම් කරන්න.
vi. පැරණි කාව්‍යයන්හි ප්‍රධාන කාර්යය වූයේ කුමක්ද?

ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වනසේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

යක්ෂ යන වචනය ඇසෙන විට අපට සිහිපත් වනුයේ ගොරහැඩි පෙනුමක් ඇති තියුණු බැලුම් ඇති මිනිසුනට හදිකරන අණගුණ නොදන්නා එසේම පියවි ඇසට නොපෙනෙන අද්භූත බලවේගයන් සහිත අමනුෂ්‍ය කොටස් ය. එය අපගේ වංශකථාකරුවන් මෙන් ම භූත වෛද්‍යවරයින් ද අපට මවා පෙන්වා ඇති එහෙත් ඔවුන් පවා කිසිදාක දැක නැති කල්පිත රූපයන් මිස සත්‍යය ලෙසම අපේ රටේ යක්ෂ ගෝත්‍රික ජනතාව නම් නොවෙති. යක්ෂ ගෝත්‍රික ජනතාව ද අප මෙන් ම පියවි ඇසට පෙනෙන රූප කායක් ඇති අප මෙන්ම කන, බොන, අඳින, පලඳින, ගමන් බිමන් යන වැඩපල කරන සැබෑ මිනිස් කොටසකි. ඇතැම් විට මේ ලියන සහ කියවන ඔබ ද ඒ යක්ෂ ගෝත්‍රික සම්භවය ඇත්තෝ වන්නට ද ඉඩ ඇත. එය එසේ වෙත්නම් අප වඩාත් සාඩම්බර වන්නෝ වෙමු. යක්ෂ යන්නෙහි නිරුක්තිය වනුයේ දක්ෂ - දක්ෂයා යන්නයි. ඔවුන් සෑම වැඩකට ම දක්ෂයෝ ය. කාලය නිකරුණේ කා දමන්නෝ නොවෙති. දැය පිළිබඳ සැබෑ කැක්කුමක් ඇත්තෝ ය. කඩිසරය - කඩිසර ගමන් ඇත්තෝ වන අතර නිරතුරුව ම කිසියම් කටයුත්තක යෙදී සිටින්නෝ වෙති. කටුක දුෂ්කර පැවැත්මට ඔරොත්තු දෙන ඔවුන් ශක්තිමත් ය. ඔවුන් දක්ෂයෝ නිසාම යක්ෂ නම යෙදුණා වන්නට ඇත.

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

i. අනාගත ලෝකය අබිමුව දිනෙන් දින උග්‍රවන ස්වභාවික ඉන්ධන අර්බුදයට විසඳුම්.
ii. ලාංකීය දේශපාලනික හා ආර්ථික ස්ථාවරත්වය උදෙසා තාරුණ්‍යයේ දායකත්වය.
iii. නූතන තාක්ෂණය අවභාවිතය මත සෝදාපාළුවට ලක්වන සමාජ සාරධර්ම.
iv. පූර්ණ මිනිසකු බිහිකිරීමේලා පැරණි සාහිත්‍ය කළ මෙහෙවර.
v. බිඳ වැටෙන ආර්ථික ජීවන රටාව තුළ අරපිරිමැස්මෙහි අවශ්‍යතාව (ලකුණු 25)

04. පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

අ) i. මව හෝ පියා හෝ නුඹ හෝ ගමට යන්නේ ය.

ii. පාලකයෝ යෙහෙන් රට පාලනය කළහොත් රටවැසියෝ ඔවුන් යළි මැති සබයට යවනු ඇත.

iii. ප්‍රකට දේශකයෙක් වූ මාර්ටින් වික්‍රමසිංහ දක්ෂ නවකතා කරුවෙක් ද වෙයි.

iv. ගුණදාස අමරසේකරයන් විසින් රතුරෝසමල කෙටි කතාව රචනා කරන ලදී.

v. දෙවියෝ වැනි මිනිස්සු අප අතර වෙති.

ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. ධාතුසේන රජතුමා කලාවැව ඉදි කළේ ය.

ii. වෛද්‍යවරියක් රෝගියා සුවපත් කළා ය.

iii. රුසියානුවෝ සඳමතට යනාවක් යවති.

iv. ඔවුහු ඒ සම්මානය සඳහා දක්ෂ ක්‍රීඩිකාවක නම් කරති.

v. කිරිල්ලිය කුරුලු පැටවුන්ට ආහාර කැව්වාය.

ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. බොහෝ ප්‍රබුද්ධ ගායකයෝ (සංගීතඥයන් / සංගීතඥයෝ) ද (වෙති / වෙයි)

ii. (බුද්ධිමත්තු / බුද්ධිමතුන්) නව අදහස් ප්‍රකාශ කළහොත් ඒවාට මැනවින් කන්දිය (යුතුය/යුතුයි)

iii. දක්ෂ (චිත්‍ර ශිල්පියෙක් / චිත්‍ර ශිල්පයෙකු) මනසේ ඇඳි රූ සිතුවමට (නගයි / නගති)

iv. තමන් දෙන දන් (භික්ෂූහු / භික්ෂූන්) පිළිගනිති'යි කාශ්‍යප හිමියෝ (සිතුහ / සිතුවේය)

v. ස්වාමියා (සේවකයන් / සේවකයෝ) ලවා කඩකාමරය පිළිසකර (කරවති / කරවයි)

(ලකුණු 15)

05. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. අනු - අංගය දක්වන්න.

i. **වල්ලම්බලම දැක යාගන්** සහතොසින

(වල්ලම්බලම - සන්ධි, දැක - ක්‍රියා, යාගන් - ක්‍රියා)

ii. **කැලමල්** සුවඳ මුසුව **හමන** සුළඟ **සුම්හිරිය**

කැලමල් - සමාස, හමන - කෘදන්ත, සුම්හිරිය - අව්‍ය පද)

iii. **මැණියෝ මල්පහන්** පුදා **පා ගමනින්** නිවසට ගියාය.

(මැණියෝ - විභක්ති, මල් පහන් - සමාස, පා ගමනින් - විභක්ති)

iv. නික්ම **පුරයෙන් සෙද** - සිහිල් **සෙවණැති** රුකක් මුල සොඳ

(පුරයෙන් - විභක්ති, සෙද - නිපාත, සෙවණැති - සන්ධි)

v. හෙළන **නගන** අත **නුවනඟ බැලුම්** දි දී

(නඟන - කෘදන්ත, නුවනඟ - සන්ධි, බැලුම් - කෘදන්ත) (ලකුණු 3×5 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

අ) i. මිනිස් .......................................... විවිධ රෝගාබාධයන්ට ලක්වේ.

ii. මිහින්තලා රාජමහා .......................................... දේවානම්පියතිස්ස නරනිඳු සසුනට පූජාකළ බව සෙල්ලිපි වලින් සනාථ වේ.

iii. බාලදක්ෂ පෝතකයෝ කඳු .......................................... පුහුණු වීමට සූදානම් වෙති.

iv. කායික විද්‍යාඥයෝ මනුෂ්‍ය .......................................... පිළිබඳ සියුම් නිරීක්ෂණවල නිරත වෙත්.

v. බටහිර ජනයා විනෝදාංශය පිණිස පර්වත .......................................... සිදු කරති.

vi. වෙසක් පොහෝදා රජමහ .......................................... සිල් සුවඳින් පිරී යයි.

(සිරුර, වෙහෙර, නැගීම, ශරීරය, තරණය, විහාරය)

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

ආ) පහත සඳහන් වාක්‍ය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

මං කියන්නේන මේ රටේ මනුෂ්‍යයන් බහුතරයක් තුළ හැදිච්ච ගති ස්වභාවයන් දක්නට නෑ කියලයි.

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. **රන් දෙරණෙන්** ලබා ගන්නා මිණිකැට **ලක්මවට** ආභරණයක් වෙයි.

ii. **පුරවැසියෙනි,** ඔබ **සැමගේ** ශක්තිය දැය යළි ගොඩනගන්නට දෙනු මැනවි.

iii. වෙරළට පැමිණි කුඩා **දරුවෝ** ඈත **දියඹෙහි** නොපෙනී යන රුවල් නැව් දෙස දෑස් දල්වා බලා සිටිති.

ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

ආහ් ......... සුබම සුබ උදෑසනක් එන්න, එන්න අපිට තවත් පරක්කු වෙන්ට බැහැ ''අපි කොහෙ ද මේ යන්නෙ'' අපට ඇසුණේ අහසෙහි ගී තුරුවෙකි අප දුටු වේ විදුලි කෙටුමෙකි; එවිට ම පෙනුණේ අහස් යානයකි (ලකුණු 1/2 ×6 = 03)

උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. ''ඔබ නිරෝගී වෙත්වා !'' යැයි මෑණියෝ පැතුවෝ ය.

ii. ''තෙපි මගේ පාසලින් අස් වී යවු !'' යැයි ප්‍රධානාචාර්යතුමාණෝ අපට කියූහ.

iii. ''වහා ඇඳුම් ගෙනෙව!'' යි විමලාවෝ දාසියට කීහ. (ලකුණු 1×3 = 03)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

බුදුරජාණන් වහන්සේ මහා පුරුෂ ලක්ෂණයෙන් හා **අසූඅනුව්‍යංජන** ව්‍යාමප්‍රභා **කෙතුමාලාලංකාරයෙන් සමලංකෘත** වූ ශාන්ත දාන්ත **රූප** ශ්‍රී විභූතිය දැක බුධානුභාවයෙන් දිඔෘෂධ ස්පර්ෂයෙන් **සංහිඳවන** ලද විෂ තේජස් ඇති නාගරාජයකු පරිද්දෙන් පැමිණ **ශ්‍රීපාද** යුගලයෙහි වැතිර ගියේ ය. යුගඳුරු මුදුනෙහි දිලිසෙන්නා වූ **හිරුමඬලක්** පරිද්දෙන් සවනක් බුදු රැස් විහිඳුවමින් වැඩහිඳ මහණෙනි, මා එන්නාට පූර්වයෙහි කිනම් කථාවකින් යුක්තව උනුදැයි විචාරා .............

i. තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

ii. පුරුෂ, වැතිර, කිනම් යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙනම ලියන්න.

iii. වාක්‍ය අවසානාර්ථයේ, අනුකුලාර්ථයෙහි, ගෞරවාර්ථයෙහි යෙදෙන නිපාත පද තුනක් මෙම ඡේදයෙන් උපුටා දක්වන්න.

iv. බුධානුභාවයෙන්, දිඔෘෂධ, යුගඳුරු යන වචන විසන්ධි කරන්න.

v. මේ ඡේදයේ ඇතුළත් පාපිල්ලක් හා අඝෝෂ දන්ත ඕෂ්ඨජ අක්ෂරයක් සහිත වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු 3×5 = 15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. සිංහලයේ තත්සම පද

ii. වත්, මත් තද්ධිත ප්‍රත්‍ය භාවිතය

iii. ස්වරා දේශ සන්ධිය

iv. අන්‍යාර්ථ සමාස

v. ඕෂ්ඨජ අක්ෂර (ලකුණු 5 x 3 =15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
## Practice Test - Grade 13 - 2022

**සිංහල I** | **71 S I**

කාලය: පැය තුනයි

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: ...............................................

**උපදෙස් :-**

* **පළමු** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදාගන්න.

01. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) හා (ඒ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

අ) සිටු දියණියෝත් තුන් විටක් පැදකුණු කොටලා සතර තැනක සිට වැඳලා ''ස්වාමීනි, මේ කෙළවර දැක්ම ය, මෙවක් පටන් මුඹවහන්සේගේ මා දැක්මකුත් මාගේ මුඹවහන්සේ දැක්මකුත් නැතැ'යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙනපියා පිටිපස්සේ සිටත් සිපගෙනපියා කුමක් දෝහෝ යි සිතමින් ගල්කෙළවර පමාව සිටියහු තුමු පිටිපස්වලා එක් අතෙකින්, බොටුව අල්වා ගෙන එක් අතෙකින් පිටිමුල අල්වා ගෙන ඌගේ කායබල තරමට තමන්ගේ ඥානකෘති වූ මායාබලය මහත් හෙයින් ගල්මුඳුනෙන් දැමුව. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය. සොරපවුවේ වසන දේවතාවාණෝ උන් දෙන්නාගේ ම කටයුත්ත දැක ''හැම තැන දී ම පිරිමින් උපදෙස් දනිති'' නැත. සමහර තැනක ගෑණු ද උපදෙස් දනිති'' කිවූ ය.

i) කුණ්ඩලකේසිය ස්වාමියාට වැඳීමට පෙර කුමක් කීවේ ද?

ii) ගල් කෙළවර සිටියේ කවරෙක් ද?

iii) ''තමන්ගේ ඥානාකෘති වූ මායා බලය මහත් හෙයින්'' - මෙය ලිහිල් බසින් ලියන්න.

iv) **''පැදකුණු''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ආ) ''ස්වාමීනි අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ. මානයෙන් ම මඩනා ලදහ. නුඹවහන්සේ වැනියන් පවා නොවඳුම්හ යි මන් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කල එබඳු වූ මානයෙක් උපනී නම් එකල මහණධම් මුදුන් පැමිණිය නොදෙයි. මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණ කොට, අප පසුව මහණකොට වදාළ මැනව. එසේ කල ඔවුන් අපි වඳුම්හ. පුදම්හ; සත්කාර කරම්හ; එසේ කල අපගේ අභිමානත් සිඳෙයි; මහණධම් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙහි ලෝභයකුදු වී නම්, ''තොපගේ කපුවාණන් වැඳ පුදා නීච ක්‍රියා කොට නැවත රාජ්‍යය කරන්නට අවුදැයි ශාක්‍යයන් අපට පරිභව බෙණෙති' යි කියා ''දෙවනුව රාජ්‍ය ලෝභය ද දුරු වෙයි. මේ මේ කාරණයෙන් උන් පළමු කොට මහණ කරවා, අප පසුව මහණ කළ මැනැවැ'යි කීහ. ස්වාමිදරුවෝ ''තොප කීයේ කාරණාමය. ඥානවන්තයන් සිතුවමනා සිතුවිල්ලෙක්මය'යි වදාරා උපාලි පළමු ව මහණ කොට.......

i. ශාක්‍යයන්ගේ මනස පෙන්වන අවස්ථාවක් ලියන්න.

ii. බුදුන් වහන්සේ ශාක්‍යයන්ගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?

iii. ''නීච ක්‍රියා කොට නැවත රාජ්‍ය කරන්නට අවුදැයි...'' මෙය ලිහිල් බසින් ලියන්න.

iv. **''පරිභව''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ඉ) ඒසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනා ශබ්දය අසා පියසන් නොඇසෙන සේ සෙමෙන් සෙමෙන් අවුදින් ලියකිඳුරාණන් උන් නියාව ද නටමින් සිටි කිඳුරාඞගනාවන් ද දැක පිළිබඳ වූ සිත් ඇති ව ''මේ කිඳුරා විද දිවි තොර කොට මැ හා සමඟ වාසය කෙළෙම් නම් යහපතැ'යි සිතා සැඟවී සිට කිඳුරාට හීයක් විද්දේය. ඒ ශරප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලේ දියෙන් මහත් වේදනාවෙන් මඬනා ලදුව හඬන්නේය. ''සබඳ, චන්ද්‍රිකාව මේ මාගේ ජීවිතය තව ද ආයු ඇතිව තිබිය දී සන්තතිවිච්ඡේදයෙන් නැසෙමි' යි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නොඇලෙමි. ලද ශර ප්‍රහාරයෙන් වැහෙන්නා වූ ලෙහෙයෙන් රැඳී ඔත්තා වූ හා මාගේ ජීවිතය නොබෝ කලකින් කඳ සැඟවෙන්නේ ය. කකියා ගිය තල තෙලක ලූ තණ සෙයින් ද මුලින් සිඳ හෙළූ ගසක් සෙයින් ද නියං සමයෙහි පැන් සිඳී වියළි ගිය මළ හෝකඳුරක් සෙයින් ජීවිත විනාසයට පැමිණෙන සේ බලව. පර්වතයක්හි වසන ලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නා වූ වර්ෂා ජල ධාරාවක් සෙයින් ද කඳුළු වැහෙන්නට පටන් ගත්තේ ය.

i. පා හඬ නොඇසෙන සේ පැමිණියේ කවුරුන් ද?
ii. කිඳුරාට විද දිවි තොර කිරීමට සිතුවේ කවර හේතුවක් උදෙසාද?
iii. ''මාගේ ජීවිතය නොබෝ කලෙකින් කඳ සැඟවෙන්නේ ය.'' මෙය ලිහිල් බසින් ලියන්න.
iv. ''**සන්තති විච්ඡේදනයෙන්**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ඊ) මෙසේ චණ්ඩ පරුෂ අමනුෂ්‍යයෝ පවා ශරණගතයන් කරා පැමිණ ගින්නට ළං විය නොහෙන මැස්සන් මෙන් දුරින් ම දුරු වෙත්. ශරණානුභාවයාගේ මහන්තත්වය ආශ්චර්ය මැයි. ශරණානුභාවය පූර්වාචාරිවරයන් විසිනිදු කියන ලද මැයි. දේවපුත්‍රමාරය ක්ලෙශමාරය අභිසංස්කාරමාරය මෘත්‍යුමාරය යන සිවු මරුන් පරදවා ජය ගත්තා වූ මාරසංග්‍රාම ඇති කරුණාවෙන් වඩන ලද අදහස් ඇති තථාගතයන් වහන්සේ තමහට ශරණ ය යි කවරෙක් නම් ශරණගත නොවේ ද, එම බුදුන් විසින් වදාරන ලද සසර භය නසන බුදුන්ගේ කරුණාගුණ උපදවා ප්‍රකාශ කරන්නා වූ සද්ධර්මය ම මට ශරණ ය යි කවරෙක් නම් දහම් ශරණ නොගනී ද? අමා මහ නිවන් නමැති අමෘතපානය කළා වූ සද්ධර්මය ධරා ප්‍රකාශ කිරීමට සරු කෙත් ව සිටියා වූ සංඝරත්නය මට පිළිසරණ යයි කවරෙක් නම් ශරණගත නොවේ ද?

i. සිවු මරුන් නම් කරන්න.
ii. ශරණානුභවයාගේ මහන්තත්වය ප්‍රකාශ වන්නේ කෙසේ ද?
iii. ''අමා මහ නිවන් නමැති අමෘතපානය කළා වූ සද්ධර්මය ධරා ප්‍රකාශ කිරීමට සරුකෙත් ව සිටියා වූ සංඝරත්නය'' මෙය ලිහිල් බසින් ලියන්න.
iv. ''**ශරණගතයන්**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

උ)

| | |
|---|---|
| හිමකර සුර සිඳු කොඳ මුතු | හරෙහි |
| පැහැසර යුරු සුඳඟර ගෙන | වෙරෙහි |
| මලකර පලු පල වැනි | සුරතුරෙහි |
| මනහර සිවු සැට බරණින් | සැරහි |

| | |
|---|---|
| පිරි රුසිරෙන් බබළන සක් | සුරඟන |
| සල නුවනින් මිස වෙන සක් නො ම | වන |
| නව යොවුනෙන් දන මනසක් | පිනවන |
| පිරිවරමින් දස දහසක් | වරඟන |

i. සුදඟරහි පැහැය සම කරන්නේ කවරකට ද?
ii. සල නුවනින් මිස වෙනසක් නොවන්නේ කවුරුන් ද?
iii. ''පිරි රුසිරෙන් බබළන සක් සුරඟන
සල නුවනින් මිස වෙනසක් නොම වන'' මෙය ලිහිල් බසින් ලියන්න.
iv. ''**සුරතුරෙහි**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. ''ඉදින් මම ගෙට ගියෙම් නම් තොපගේ ගෙහිමියෝ කොයි දැ'යි විචාරති.
ii. ''එසේ වී නම් තෙපි ම ඔහු මා කරා කැඳවා ගෙන එව''.

iii. ''අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසන්නට උව මැනැවැ''.
iv. ''යම්කිසි කෙනෙකුන්ගේ මුහුණ එක් ඇසෙකින් හොබනේ නොවෙයි''.
v. ''කෝ මගේ හේන එළි කරවා ගන්ඩ පුතෙක්?''
vi. පහ හය නෙමේ බොලන් තව ටික දවසකින් ඔක්කෝම ඉවරයි''
vii. ''අසිරිමත් වූ දෙයක් වෙතත් - කුතුහලය ඇතත් සිතේ'' (ලකුණු 03 x 04 = 12)

ඵ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂය සහ කාව්‍ය දර්ශනය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

හිරු එළිය ගලා එයි කුටියට
කවුළු පියන් පත් අතරින්
සුපුරුදු විලසින් ම
එහෙත් කිම
ඒ හිරු එළිය අද දින
මලානික වී
අවදි නොකරන්නේ මසිත

ඇසෙන නෙක විහඟ ගී නද
අලුයමින් පෙරදා ලෙස
රිදුම් දෙනු විනා මා සිත
නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්

පිපී අතු අග නෙක මල්
සැලෙනා නමුදු මඳ පවනේ
හද සැනසූ සුවඳ පෙර දින
නොදැනෙන්නේ කිම ද අද දින

වෙළාගෙන මා ගත සිත
පාළුව ගලාවිත් මා වට කොට
අත් මිදෙනු කෙලෙස ද
මේ රුදු පාළු හැඟුමින්

දුරු රටක ගිය මා පුතු
එනතුරු බලා හිඳිනට
හුරු කොට ගත යුතු නොවෙ ද
මා නෙතු

සඟවා වුවද කඳුළැලි
දුරු රටක ගිය ඔහු
මා පුතු ද
මා හිත මිතුරු ද බැවින. (ලකුණු 12)

02. ''සද්ධර්මරත්නාවලි කතුහිමි ස්වකීය කථා රචනයේ දී ගැඹුරු බෞද්ධ දර්ශනයක් බුද්ධකාලීන චරිත ඇසුරුකරගන ඉදිරිපත් කරයි.'' පැහැදිලි කරන්න. (ලකුණු 15)

**නැතහොත්**

''ජාතක කතාකරුවා මිනිස් සිත විනිවිද දැකීමේ සමතෙකි.'' නිර්දේශ ජාතක කතා ඇසුරින් උචිත අවස්ථා ගෙනහැරපාමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

03. පහත (අ) කොටසේ ප්‍රශ්නය හා (ආ) කොටසින් තවත් එක් ප්‍රශ්නයක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.

අ) කවර සාහිත්‍ය යුගයක වුව ද මෙරට ගද්‍ය කාව්‍ය රචකයෝ ධර්ම ග්‍රන්ථ සම්පාදනයේ දී පොදු ලක්‍ෂණ කීපයකට අනුගතව ඇත. ඔබට අදාළ පූජාවලිය හා සද්ධර්මාලංකාර කතා පුවත් ඇසුරින් පහදන්න. (ලකුණු 07)

ආ) මානව ගුණධර්ම හා හර පද්ධතීන් ඇසුරින් චරිත සංවර්ධනය ගොඩනගා ගැනීමට සද්ධර්මාලංකාර කතුවරයාගේ කතා කොතෙක් දුරට ඉවහල් වන්නේ දැයි අදාළ කතා වස්තු ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 08)

නැතහොත්

පූජාවලි කතුහිමි සජීවී ව හා රසවත් ව අවස්ථා හා සිද්ධි නිර්මාණය කරමින් හරවත් ජීවිතයකට මඟ පෙන්වයි. අදාළ කතා පුවත් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

04. වර්ණනාවල විවිධත්වයට අනුරූපවන ලෙසට උචිත විරිත් නිර්මාණයෙහිලා ගුත්තිල කාව්‍ය කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය වර්ණනා **තුනක්වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15)

05. ස්වභාව ධර්මයන්ගේ හිංසනයන්ට ලක් වීමත් ප්‍රබලයින්ගෙන් දුබලයන් පීඩාවට පත් වීමත් බැද්දේගම ගම්වාසීන්ගේ ජීවිත තුළින් මැනවින් විවරණය වේ. නිදසුන් තුනක්වත් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

06. නිර්ධන පාන්තිකයන්ගේ දුක්ඛ දෝමනස්ස වස්තුවිෂය කර ගනිමින් ඔවුන් වෙත සානුකම්පිත දෘෂ්ටියක් හෙළීමට නූතන කෙටිකතාකරුවන් සමත් වී ඇති බව නිර්දිෂ්ට කෙටිකතා තුනක්වත් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

07. සම්ප්‍රදාය තුළ අනුගත කාව්‍ය ලක්ෂණ සුරකිමින් වුව ද විවිධ තේමා ඔස්සේ නිර්මාණකරණයේ යෙදෙමින් සහෘදයාට ආනන්දනීයත්වය හා බුද්ධිය ලබා දීමට හෙළ හවුලේ කවියා සමත් වී ඇත. අදාළ පද්‍ය නිර්මාණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

08. ගතානුගතික අධ්‍යාපන ක්‍රමයක ඵලය ලෙස ස්වර්ණතිලකා ඛේදනීය මරණයකට පත් විය. නාට්‍ය පෙළ ඇසුරින් සනිදර්ශිතව පහදන්න. (ලකුණු 15)

# පිළිතුර පත්‍රය සිංහල I පත්‍රය 13 වසර

01. අ) i. මේ වනාහි අවසන් දැක්ම බවත්, මින් පසු ඔබට මා දැකීමටත්, මට ඔබව දැකීමටවත් නැතිබවයි.

ii. ස්වාමියා / සොරදෙටුවා

iii. ''තමන්ගේ නුවණේ ස්වරූපය ගත් අනුන් රවටීමේ බලය බොහෝ බැවින්''

iv. ප්‍රදක්ෂිණ - පිදුම ලබන්නා දෙසට තම දකුණත සිටින සේ හැරී ඒ වටා ගමන් කිරීම.

(ලකුණු 1×4 = 4)

ආ) i. ශාක්‍යයන්, බුදුන් වහන්සේ පවා නොවදින පිරිසක් බව ඔවුන් විසින්ම පැවසීම.

ii. ඥානවත්තයින් විසින් සිතිය යුතු සිතුවිල්ලක් මා ප්‍රකාශ කළ බව පැවසීම.

iii. පහත් කටයුතුවල යෙදී නැවත රාජ්‍ය කටයුතු කිරීමට පැමිණියේ ද?

iv. හෙළාදැකීම / නින්දා කිරීම / නිග්‍රහ කිරීම.

(ලකුණු 1×4 = 4)

ඉ) i. බරණැස් රජු

ii. කිඳුරිය ලබා ගැනීමට/ කිඳුරිය සමඟ වාසය/ විසීම සඳහා

iii. මාගේ ජීවිතය ටික වේලාකින් සිරුර නැති වන්නේය. (මැරෙන්නේය.)

iv. ජලයේ සිඳී ගිය කුඩා ඇල පාරක්

(ලකුණු 1×4 = 4)

ඊ) i. දේවපුත්‍ර මාරය

ක්ලේශ මාරය

අභිසංස්කාර මාරය

මෘත්‍යුමාරය

ii. ගින්නට ළංවිය නොහෙන මැස්සන් මෙන්.

iii. මරණයක් නොමැති / නිර්වාණය නැමැති අමා පැන් පානය කළා වූ සදහම දරා පැවසීමට සාර වූ කුඹුරක් / කෙතක් ව සිටියා වූ සඟ රුවන.

iv. සරණ + ආගත. සරණ පිණිස පැමිණ අය. (ලකුණු 1×4 = 4)

උ) i. චන්ද්‍රයා, ආකාශ ගංගාව, මුතු මාලය යන ඒවායේ පැහැය

ii. නාඹර වයසින් යුත් රුවැති ස්ත්‍රිය

iii. සිරුණා වූ රූපශ්‍රීයෙන් දිදුලන්නා වූ ඇසිපිය හෙළීමෙන් මිස සක්‍රයාගෙන් දිව්‍යංගනාවන් හා වෙනසක් නොමැති

iv. දිව්‍යලෝකයේ ඇතැයි සැලකෙන සිතූ පැතූ සම්පත් ලබාදෙන දිව්‍ය වෘක්ෂය

(ලකුණු 1×4 = 4

ඌ) i. ධර්මසේන හිමියන් විසින් දඹදෙණි යුගයේ දි ලියන ලද සද්ධර්මරත්නාවලියේ එන කුණ්ඩලකේසීගේ වස්තුවෙන් උපුටා ගන්නා ලදී. කුණ්ඩලකේසි නම් සිටු දියණිය තම ස්වාමියා වන සොරදෙටුවා මැරූ අවස්ථාවේ දී සිටු දියණිය විසින් සිතන ලද්දකි.

ii. මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියෙහි ජීවක කතා වස්තුවෙන් උපුටා ගන්නා ලදී. භගන්දරාබාධය නිසා බිසෝවරුන් ගෙන් නිතර සරදමට ලක්වන බිම්බිසාර රජුගේ රෝගය සුව කිරීමට අභය රාජ කුමරු තම පුතාට හැකි බව පැවසූ අවස්ථාවේ ඉන් සතුටට පත් වූ බිම්බිසාර රජු විසින් අභය රාජ කුමාරයාට පැවසුවකි.

iii. කුරුණෑගල යුගයේ බහුකර්තෘ මණ්ඩලයකින් සම්පාදිත පන්සිය පනස් ජාතක පොතේ චුල්ල ධනුද්ධර ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. ගඟ අසල සිටි ස්ත්‍රිය පිළිබඳ දැන ගත් ශක්‍රයා ඇයට අපහාස කිරීමට සිතා පංචශීඛ හා මාතලි කැඳවූ අවස්ථාවේ ශක්‍රයා විසින් පැවසුවකි.

iv. II ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දිවාණිජ වස්තුවෙන් උපුටා ගන්නා ලදී. ඇමතිවරයා රන් දහසක් දී රහසේ යැවූ දාසිය විසින් වෙළෙඳ බිරිඳගේ සිත ඇමතිවරයා කෙරෙහි යොමු කිරීමට උත්සහ දරන අවස්ථාවේදී වෙළඳ බිරිඳ විසින් එම දාසියට පැවසුවකි.

v. ලෙනාඩ් වුල්ෆ් විසින් රචිත ඒ.පී. ගුණරත්න විසින් පරිවර්තිත බැද්දේගම නවකතාවෙන් උපුටා ගත්තකි. ඩිංගිහාමිට ගැහැනු දරුවන් දෙදෙනෙකු ලැබුණු බව පැල තුළ සිටි ගැහැනුන් පැවසුවිට සිලිඳු කෝපයට පත් වූ අවස්ථාවේ සිලිඳු විසින් ඩිංගිහාමිට පැවසුවකි.

vi. ලියනගේ අමරකීර්ති විසින් ලියන ලද ''හැත්තෑලක්ෂයෙන් එකෙක්'' කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. දිනෙන් දින පළාතේ උස පොල්ගස් කැපීමේ ව්‍යසනය නිසා සිලොරිස්ගේ වෘත්තියට කණකොකා හඬන්නට විය. සෝමරත්න මැටිවලෙන් ගොඩ එමින් සිලෝරිස් ගෙන් දිනකට ගස් 5ක් 6ක් ද හම්බවෙන්නේ ඇයි? විමසූ අවස්ථාවේ සිලොරිස් විසින් සෝමරත්න පැවසුවකි.

vii. මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර විසින් රචිත පේමතෝ ජායතී සොකෝ නාට්‍යයේ එන පාඨයේ සිසුහු ස්වර්ණ තිලකාව මත් වූ හස්පීයා ලවා මරණයට පත්කිරීමට ඇය මහමඟට ගැනීමේ සිතුවිල්ලෙන් ඇය මුලා කොට එන මෙන් ආයාචනා කළ අවස්ථාවේ ස්වරණාතිලකා විසින් සිසුන්ට පැවසුවකි. (ලකුණු $3 \times 4 = 12$)

| | |
|---|---|
| කතෘවරයා, කෘතිය, කතා වස්තුව, කතාව - | ලකුණු 01 |
| කා විසින් කා හටද | ලකුණු 01 |
| අවස්ථාවට | ලකුණු 01 |
| සමස්තය | ලකුණු 03 |

එ) මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂය වන්නේ තම සහජාත පුත්‍රයා විදෙස්ගත වීම පිළිබඳ පියෙකු තුළ ඇති වන කම්පනයයි. එම භාවමය අත්දැකීමට පාඨකයා සහභාගී කරවා ගත හැකි ආකාරයට පැදිපෙළ රචනා කර ඇත.

කවියා තුළ ඇති භාවමය ප්‍රකම්පනය පාරිසරිකත්වය හා බැඳී විවරණය කරයි. කුතුහලය ජනනය කරමින් තම සිතෙහි හට පාලුව, කාන්සිය ප්‍රතිනිර්මාණය කර ගැනීමට කවියා සමත් වී ඇත. මේ කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුරු ඇගයීමට ලක් කරන්න.

- **ප්‍රශ්න අංක 02 සිට 08 දක්වා සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු කෙරෙහි අවධානය යොමු කරමින් ලකුණු ප්‍රදානය කරනු මැනවි.**